# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## ශ්‍රී බාලාභිවෘධි වර්ධන සමිතිය
## (සංස්ථාගත කිරීමේ)

**ශ්‍රී බාලාභිවෘධි වර්ධන සමිතිය සංස්ථාගත කිරීම
සඳහා වූ පනත් කෙටුම්පතකි**

---

මාතර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු බුද්ධික පතිරණ මහතා
විසින් 2013 මාර්තු මස 06 වන දින ඉදිරිපත් කරන ලදී.

(ගැසට් පත්‍රයේ පළ කළේ 2013 පෙබරවාරි මස 11 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී.

---

[210 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිළ : රු. 8.00 යි. තැපැල් ගාස්තුව : රු. 5.00 යි.

# ශ්‍රී බාලාභිවෘධි වර්ධන සමිතිය
# (සංස්ථාගත කිරීමේ)

## ශ්‍රී බාලාභිවෘධි වර්ධන සමිතිය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.

පූර්විකාව.

“ශ්‍රී බාලාභිවෘධි වර්ධන සමිතිය” යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන සමිතියක් එකී සංගමයේ සාමාජිකයන් එකඟ වූ රීති අනුව, එහි පරමාර්ථ සහ ඊට අදාළ කාරණා ඵලදායි ලෙස ක්‍රියාවේ යෙදීමේ කාර්යය සඳහා මෙතෙක් කල් ශ්‍රී ලංකාවෙහි වල්පොල ගමෙහි පිහිටුවා තිබූ හෙයින් ද:

එකී සමිතිය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කරුණු සඳහා ද, ඒ පරමාර්ථ සහ කරුණු මෙතෙක් කල් එකී සමිතිය විසින් සාර්ථක ලෙස ක්‍රියාත්මක කර සහ ඉටු කර ඇති හෙයින් සහ එකී සමිතිය සංස්ථාගත කිරීමට ඉල්ලීමක් කර ඇති හෙයින් ද එම ඉල්ලීම ඉෂ්ට කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

1. මේ පනත 2013 අංක    දරන ශ්‍රී බාලාභිවෘධි වර්ධන සමිතිය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ශ්‍රී බාලාභිවෘධි වර්ධන සමිතිය සංස්ථාගත කිරීම.

2. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන් පසු (මෙහි මින් මතු “සමිතිය” යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී බාලාභිවෘධි වර්ධන සමිතියේ දැනට සාමාජිකයන්ව සිටින තාක් තැනැත්තන් සහ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු ඇතුළත් කරගනු ලබන තැනැත්තන් (මෙහි මින් මතු “සංස්ථාව” යනුවෙන් සඳහන් කරනු ලබන) “ශ්‍රී බාලාභිවෘධි වර්ධන සමිතිය” යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු ය, තව ද, එකී නාමයෙන් ඒ සංස්ථාව විසින් ද, එයට විරුද්ධව ද සියලු අධිකරණවල දී නඩු පවරනු ලැබිය හැකි අතර, පොදු මුද්‍රාවක් තබාගෙන එය පාවිච්චි කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද, පූර්ණ බලය සහ අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

3. සංස්ථාව සංස්ථාගත කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද ඒ පොදු පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:—

2—PL 006935—75 (2013/01)

(අ) වල්පොල ග්‍රාමයෙහි පොදු දියුණුව උදෙසා ද බාල පරපුරේ අභිවෘද්ධිය සඳහා සමාජසේවා කටයුතුවල යෙදීම සහ ලක්දිව බුදුසසුන පිහිටුවා වදාල මහා මහින්ද මහ රහතන් වහන්සේ ගුණානුස්මරණය කිරීම සඳහා වාර්ෂිකව මහා මහින්ද උත්සවයේදී සහිත පොසොන් මහා පෙරහැර පැවැත්වීම;

(ආ) වල්පොල ග්‍රාමය ඇතුළත සහ සමිතිය විසින් තීරණය කරනු ලබන වෙනත් ප්‍රදේශ තුළ ප්‍රජා සුභසාධන, සංස්කෘතික සහ සමාජ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ ඒවායේ නිරතවීම;

(ඇ) නගර සහ ගම් සංවර්ධනය කිරීමට හේතුවන මාර්ග සංවර්ධනය සහ නිවාස යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම, ආරෝග්‍යශාලා, අධ්‍යාපන මධ්‍යස්ථාන, පාසල්, ප්‍රජා මධ්‍යස්ථාන සහ එවැනි වෙනත් ගොඩනැගිලි ඉදි කිරීම හා වැඩිදියුණු කිරීම සහ වෙනත් කටයුතු ක්‍රියාත්මක කිරීම;

(ඈ) පෙර පාසලක් සහ පුස්තකාලයක් පිහිටුවීම, ඒවාට අවශ්‍ය දෑ සැපයීම සහ ඒවා නඩත්තු කොට පවත්වාගෙන යාම;

(ඉ) ජාත්‍යන්තර වශයෙන් ධර්ම ප්‍රචාරය කිරීමේ කටයුතුවල යෙදීම;

(ඊ) බෞද්ධ දර්ශනය සහ ජීවන මාර්ගය ආරක්ෂා කිරීම හා ප්‍රචාරය කිරීම;

(උ) ශ්‍රී ලංකාවේ හා පිටරට වෙනත් බෞද්ධ සංවිධාන සමග මිත්‍ර සම්බන්ධතා ඇතිකර ගැනීම;

(ඌ) පිරිවෙන්, පාසල් සහ අධ්‍යාපන ආයතන පිහිටුවා නඩත්තු කිරීමෙන් සහ ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීමෙන් අධ්‍යාපනය නංවාලීම සහ ප්‍රවර්ධනය කිරීම;

(එ) දුප්පත්, අනාථ සහ රෝගී තැනැත්තන්ට වෛද්‍ය සහන, ආහාර, ඇඳුම් පැළඳුම් සහ නිවාස සැපයීම;

(ඒ) අනාථ නිවාස සහ මහළු නිවාස අසරණ අය සඳහා පිහිටුවීම සහ පවත්වාගෙන යාම සහ සමාජ සුභසාධන මධ්‍යස්ථාන පිහිටුවීම;

(ඔ) අඳ, ගොළු, බිහිරි සහ ආබාධිත තැනැත්තන් සඳහා ශුභසාධන පහසුකම් සැලසීම සහ නිවර්තන නිවාස පිහිටුවීම;

(ඕ) සංස්ථාවේ පරමාර්ථ මුදුන්පත් කරගැනීමෙහි ලා නිරතවන ස්වේච්ඡා සේවකයන්ට සහ වෙනත් තැනැත්තන්ට ශිෂ්‍යත්ව මගින්, මුදලින් හෝ අන්‍යාකාරයකින් ආධාර දීම;

(ක) පුස්තකාල පිහිටුවා පවත්වාගෙන යාම, පොත්පත්, සඟරා, සමරු කලාප සහ වාර සඟරා ආදියට දායකවීම සහ ඒවා නිකුත් කිරීම සහ සංස්ථාවේ පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා යෝග්‍ය වෙතැයි සළකනු ලබන වෙනත් සේවා සැළසීම;

(ග) දිළිඳු දරුවන්ට යම් වෙළෙඳාමකට, රක්ෂාවකට හෝ සේවයකට සූදානම් වීමේ, ඇතුළත්වීමේ හෝ නිරතවීමේ අවස්ථා සැලසීම සහ ඔවුන්ට ඇඳුම් පැලඳුම්, අධ්‍යාපනය හෝ වෙනත් පහසුකම් සැලසීම;

(ජ) අධ්‍යාපනය සහ දැනීම වැඩිදියුණු කිරීම, ව්‍යාප්ත කිරීම සහ ප්‍රචාරය කිරීම සඳහා ශිෂ්‍යාධාර, ශිෂ්‍යත්ව, ත්‍යාග, පරිත්‍යාග මුල්‍යාධාර සහ වෙනත් ආකාරයෙන් වූ ආධාර සැලසීම සහ පාසල් පුස්තකාල සහ සංස්කෘතික මධ්‍යස්ථාන පිහිටුවීම;

(ට) යම් කර්මාන්තයක හෝ වෙළෙඳාමක නැතහොත් යම් අපනයන හෝ ආනයන ව්‍යාපාරයක නිරතවීම සහ කෘෂිකාර්මික, කාර්මික සහ වාණිජ ව්‍යාපාර සහ නිෂ්පාදන අපනයනය කිරීම වැනි කර්මාන්ත ආරම්භ කොට පවත්වාගෙන යාමට තැනැත්තන්ට ආධාර දීම සහ සහාය වීම සහ තාක්ෂණය සහ ශිල්පී ක්‍රම ජනතාවට සාර්ථක ලෙස ලබා දීම සඳහා පුහුණු කිරීමේ වැඩසටහන් සහ ව්‍යාප්ති සේවාවන් සහ ප්‍රචාරක කටයුතු සංවිධාන කිරීම;

(ඩ) සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ වෙනත් යම් විදේශීය හෝ දේශීය ආයතනයක් හෝ සංවිධානයක් සමග සහයෝගයෙන් ක්‍රියා කිරීම හෝ සහභාගි වීම;

(ත) සංස්ථාවේ පරමාර්ථ මුදුන්පත් කර ගැනීම සඳහා ශ්‍රී ලංකාවෙහි හෝ වෙනත් යම් ස්ථානයක දී සම්මේලන,

සම්මන්ත්‍රණ, වැඩමුළු, සමූහ අධ්‍යාපන සහ දේශන සඳහා අනුග්‍රහය දැක්වීම සහ ඒවා පවත්වා ගෙන යාම;

(ද) සංස්ථාවේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීම සහ වැඩිදියුණු කිරීම සඳහා යෝග්‍ය යයි සංස්ථාව විසින් සලකනු ලබන පොත්, වාර සඟරා, පත්‍රිකා, ප්‍රවෘත්ති පත්‍ර සහ සඟරා මුද්‍රණය කිරීම ප්‍රකාශයට පත් කිරීම සහ බෙදාහැරීම ; සහ

(න) සංස්ථාවේ සියලු පරමාර්ථ හෝ ඉන් කිසිවක් මුදුන්පත් කර ගැනීමට අවශ්‍ය ආනුෂංගික හෝ හිතකර වෙනත් යම් ක්‍රියා සහ දේ ඉටු කිරීම.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

**4.** (1) සංස්ථාවේ කළමනාකරණය, පාලනය සහ පරිපාලනය සංස්ථාවේ සාමාජිකයන් අතුරින් සංස්ථාවේ රීතිවලට අනුකූලව තෝරා පත්කර ගනු ලැබූ පාලකවරයන් සංඛ්‍යාවකගෙන් සමන්විත (මෙහි මින් මතු "සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) පාලක සභාවක් වෙත පැවරේ.

(2) මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී මෙහි උපලේඛනයෙහි නම් සඳහන්ව ඇත්තා වූ සාමාජිකයන්ගෙන් සමන්විත පදනමෙහි පාලක සභාව සංස්ථාවේ ප්‍රථම සභාව විය යුතු ය.

සාමාජික නාම ලේඛනය.

**5.** මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දිනයට පෙරාතුවම වූ දිනයේ දී සමිතියේ සාමාජිකයකු වූ සෑම තැනැත්තකුගේම සහ ඉන් පසුව සංස්ථාවේ සාමාජිකයකු වශයෙන් යථාපරිදි ඇතුළත් කර ගනු ලබන සෑම තැනැත්තකුගේම නම ඇතුළත් කළ යුතු සාමාජික නාම ලේඛනයක් පවත්වාගෙන යාමට පාලක සභාව විසින් සැලැස්විය යුතු ය.

දේපල අත්කර ගැනීම, අරමුදල් ආයෝජනය කිරීම සහ ණය ගැනීම යනාදිය පිළිබඳ සංස්ථාවේ බලතල.

**6.** මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව:—

(අ) සංස්ථාවේ කාර්ය සඳහා අවශ්‍ය වන්නා වූ ඉඩම් හෝ ගොඩනැගිලි මිලට ගැනීමට, අත්කර ගැනීමට, කුලියට ගැනීමට, ඉදිකිරීමට හා අන්‍යාකාරයකින් ලබා ගැනීමට;

(ආ) සංස්ථාවේ කාර්ය සඳහා මුදල් ණයට ගැනීමට හෝ ලබා ගැනීමට;

(ඇ) විනිමය බිල්පත්, චෙක්පත්, පොරොන්දු නෝට්ටු සහ වෙනත් ගනුදෙනු කළ හැකි සාධන පත්‍ර සෑදීමට, ලිවීමට, භාර ගැනීමට, වට්ටම් දීමට, ගනුදෙනු කිරීමට, මිලට ගැනීමට, විකිණීමට, නිකුත් කිරීමට සහ බැංකු ගිණුම් විවෘත කිරීමට, ක්‍රියාත්මක කිරීමට සහ වැසීමට;

(ඈ) සංස්ථාවේ කාර්ය සඳහා වහාම අවශ්‍ය නොවන යම් අරමුදල් සභාව විසින් සුදුසුයයි සලකනු ලබන ආකාරයකින් ආයෝජනය කිරීමට;

(ඉ) දායක මුදල්, සම්මාදම්, ප්‍රදානයන්, පරිත්‍යාග සහ සියලු වර්ගවලට අයත් ත්‍යාග ඉල්ලා සිටීමට සහ භාර ගැනීමට;

(ඊ) යම් තැනැත්තකු යම් සමාගමක් හෝ පුද්ගල මණ්ඩලයක් සමග ගිවිසුම්වලට හෝ කොන්ත්‍රාත්වලට එළඹීමට;

(උ) යම් ස්ථාවර දේපලකට හෝ පෞද්ගලික දේපලකට බලපාන කොන්දේසි භාර ගැනීමට, පිළිගැනීමට, ක්‍රියාත්මක කිරීමට ඉටු කිරීමට සහ පරිපාලනය කිරීමට;

(ඌ) සංස්ථාවේ නිලධරයන් සහ සේවකයන් පත් කිරීමට, සේවයෙහි නියුක්ත කිරීමට, සේවයෙන් පහ කිරීමට හෝ ඔවුන්ගේ සේවය අවසන් කිරීමට සහ සංස්ථාව විසින් තීරණය කරනු ලබන යම් වැටුප්, දීමනා සහ පාරිතෝෂික ඔවුන්ට ගෙවීමට;

(එ) සංස්ථාවේ කාර්ය සඳහා ශ්‍රී ලංකාවේ දී හෝ විදේශයන් හි දී සේවක පිරිස් පුහුණු කිරීමට; සහ

(ඒ) සංස්ථාවේ පරමාර්ථ නිසි ලෙස සහ ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය හෝ අවස්ථානුකූල වෙනත් සියලු දේ කිරීමට,

සංස්ථාවට බලය ඇත්තේ ය.

7. (1) සංස්ථාව විසින් යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන් මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති පහත දැක්වෙන සියලු කාරණා හෝ ඉන් කිසිවක් සඳහා කලින් කල සෑදීම නීත්‍යානුකූල වන්නේ ය:— සංස්ථාවේ රීති.

(අ) සාමාජිකයන් වර්ග කිරීම, එක් එක් පන්තියට අයත් සාමාජිකයන් විසින් ගෙවිය යුතු ගාස්තු, ඔවුන් ඇතුළත් කර ගැනීම, ඔවුන් නෙරපීම හෝ ඉල්ලා අස්වීම;

(ආ) සභාව තෝරා පත්කර ගැනීම, සභාවේ නිලධරයන් ධුර අත් හැරීම හෝ ධුරයෙන් ඉවත් කිරීම සහ සභාවේ බලතල කාර්ය සහ චර්යාව;

(ඇ) සංස්ථාවේ විවිධ නිලධරයන්, අනුයෝජිතයන් සහ සේවකයන් පත් කිරීම, ඔවුන්ගේ බලතල, කාර්ය, කර්තව්‍ය සහ චර්යාව;

(ඈ) සභාවේ, සංස්ථාවේ හෝ යම් අනුකාරක සභාවක රැස්වීම්වල දී පිළිපැදිය යුතු කාර්ය පටිපාටිය, එම රැස්වීම් කැඳවීම සහ පැවැත්වීම එම රැස්වීම්වල දී පුරප්පාඩු පිරවීම, දැන්වීම් සහ න්‍යාය පත්‍ර, රැස්වීම් පිළිබඳ ගණපූරණය සහ එහි දී කටයුතු කරගෙන යාම;

(ඉ) සභාවේ සහ සංස්ථාවේ සාමාජිකත්වය සඳහා සුදුසුකම් සහ නුසුදුසුකම්;

(ඊ) සංස්ථාවේ දේපළ පරිපාලනය කිරීම හා කළමනාකරණය කිරීම; සහ

(උ) සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ මුදුන්පත් කර ගැනීම.

(2) මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දිනයට පෙරාතුවම වූ දිනයේ දී පැවැති පදනමේ රීති. මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවනතාක් දුරට සංස්ථාවේ

රීති ලෙස සලකනු ලැබිය යුතු අතර, එම රීති මේ වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ සාදන ලද රීතියක් මෙන් එවැනිම රැස්වීමක දී එවැනිම ආකාරයෙන් සංශෝධනය කිරීම. වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකිය .

(3) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

සංස්ථාවේ අරමුදල.

**8.** (1) සංස්ථාට එහිම අරමුදලක් තිබිය යුතු අතර, සංස්ථාව සඳහා සහ වෙනුවෙන් භාරගනු ලබන ත්‍යාග, රික්තවරණ පැවරීම්, පරිත්‍යාග, සම්මාදම් මුදල්, දායක මුදල්, ගාස්තු හෝ ප්‍රදාන සභාව විසින් තීරණය කරනු ලබන පරිදි එක් බැංකුවක හෝ බැංකු වැඩි ගණනක සංස්ථාවේ බැරට තැන්පත් කරනු ලැබිය යුතු ය.

(2) මේ පනත යටතේ ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී සහ ඉටු කිරීමේ දී සංස්ථාව විසින් දරන ලද වියදම් කිසිවක් පියවීමට අවශ්‍ය සියලු මුදල් අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

ගිණුම් සහ විගණනය.

**9.** (1) සංස්ථාවට ලැබුණු සහ සංස්ථාව විසින් වියදම් කරනු ලැබූ සියලු මුදල් පිළිබඳව ගිණුම් නිසි අයුරින් තැබීමට පදනම විසින් කටයුතු සැලැස්විය යුතු ය.

(2) සෑම වර්ෂයක දී ම යටත් පිරිසෙයින් එක්වරක් සංස්ථාවේ ගිණුම් පරීක්ෂා කොට විගණනය කළ යුතු ය.

සමිතිය විසින් සහ සමිතියට ගෙවිය යුතු ණය.

**10.** මේ පනත ක්‍රියාත්මකවන දිනයට පෙරාතුව ම වූ දිනයෙහි සමිතියෙහි පැවති සියලු ණය සහ බැරකම් සංස්ථාව විසින් ගෙවා නිදහස් කළ යුතු අතර, එදිනට සමිතියට ගෙවිය යුතු සියලු ණය, සම්මාදම් මුදල් සහ දායක මුදල් මේ පනතේ කාර්යය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාව විසින් චංචල සහ නිශ්චල දේපල දැරිය හැකි බව.

**11.** මිලට ගැනීමේ, ප්‍රදානය කිරීමේ, ත්‍යාග කිරීමේ හෝ බදු දීමේ යම් සාධන පත්‍රයක් මත හෝ එවැන්නක් ප්‍රකාර හෝ අන්තිම කැමති පත්‍රයකින් දේපල බැහැර කිරීමක් මත හෝ එවැන්නක් ප්‍රකාර හෝ අන්‍යාකාරයකින් හෝ ලැබෙන චංචල හෝ නිශ්චල සියලු දේපල අත්කර ගැනීමට සහ දැරීමට නීතියෙන් සංස්ථාවට

බලය ඇති අතර, එවැනි සියලු දේපල සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට සහ භාරවලට යටත්ව ද අදාළ සාධන පත්‍රවල හෝ දේපල බැහැර කිරීමේ අන්තිම කැමති පත්‍රයේ විධිවිධානවලට හා කොන්දේසිවලට යටත්ව ද (ඒ බලතල සහ භාරවලට අදාළ යම් ලිඛිත නීතියක විධිවිධානවලට අදාළ සාධන පත්‍රය හෝ දේපල බැහැර කිරීමේ අන්තිම කැමති පත්‍රයේ විධිවිධානවලට යටත්ව) විකිණීමේ, උකස් කිරීමේ, බදු දීමේ, හුවමාරු කිරීමේ, බැඳතැබීමේ හෝ යටත් කිරීමේ පූර්ණ බලය ඇතිව, මේ පනතේ කාර්ය සඳහා සංස්ථාව විසින් ඒ සියලු දේපල දැරිය යුතු ය.

**සංස්ථාවේ මුද්‍රාව තැබිය යුතු ආකාරය.**

**12.** සභාවේ සාමාජිකයකු සහ ලේකම්වරයා හෝ සභාව විසින් යථා පරිදි බලය දෙනු ලැබූ වෙනත් යම් තැනැත්තකු ඉදිරිපිටදී හැර, සංස්ථාවේ මුද්‍රාව කවර වූ යම් සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඔවුන් විසින් ඒ සාධන පත්‍රයෙහි තම නම අත්සන් කළ යුතු ය. තව ද එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් කරනු ලැබූ අත්සනට පරිබාහිරව විය යුතු ය.

**සාමාජිකයන්ගේ වගකීම සීමා කිරීම.**

**13.** සංස්ථාවේ කිසිම සාමාජිකයෙක් සංස්ථාවේ ණය සහ බැරකම් නිදහස් කිරීමේ කාර්යය සඳහා වෙනත් යම් කාර්යයක් සඳහා ඔහුගෙන් සංස්ථාවට අය විය යුතු ග්‍රාහක මුදල් ප්‍රමාණය ඉක්මවන යම් සාමාජික මුදලක් ගෙවීමට යටත් නොවන්නේ ය.

**විසුරුවා හැරීමේ දී ඉතිරි වන දේපල.**

**14.** සංස්ථාව විසුරුවා හැරීමේ දී එහි සියලු ණය සහ බැරකම් පියවීමෙන් පසු කවර හෝ දේපලක් ඉතිරි වුවහොත්, ඒ දේපල සංස්ථාවේ සාමාජිකයන් අතර, බෙදනු නොලැබිය යුතු අතර, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද, ස්වකීය රීති අනුව යම් ආදායමක් හෝ දේපලක් ස්වකීය සාමාජිකයන් අතර, බෙදා දීම තහනම් කරනු ලබන්නා වූ ද, වෙනත් යම් ආයතනයකට හෝ ආයතනවලට ඒ දේපල දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය.

**ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.**

**15.** මේ පනතේ සඳහන් තැනැත්තන්ගේ සහ ඔවුන් මගින් ඔවුන්ගෙන් සහ ඔවුන් යටතේ හිමිකම් පාන්නවුන්ගේ අයිතිවාසිකම්වලට හැර, ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තන්ගේ හෝ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

**16.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

උපලේඛනය

| | |
|---|---|
| ප්‍රධාන අනුශාසකද (පැවිදි) | අමරපුර අරියවංශ සද්ධම්ම යුක්තික මහා නිකායේ හලාවත පුත්තලම දෙදිසාවේ සහ දකුණු අළුත්කුර කෝරළයේ ප්‍රධාන සංඝනායක වල්පොල ශ්‍රී විමලරත්නාරාමාධිපති, සද්ධර්ම කීර්ති ශ්‍රී වාගීශ්වරාචාර්ය ශාස්ත්‍ර විශාරද පණ්ඩිත පූජ්‍ය කළුගල සෝරත නාහිමි. |
| ප්‍රධාන අනුශාසක (ගිහි) | හිටපු දිසා විනිසුරු ජී. ඩී. කුලතිලක මහතා |
| ප්‍රධාන සභාපති | විද්‍යාවේදී පී. ආර්. ගාමිණී සිරිසේන මහතා (මුළු දිවයිනටම සාමවිනිසුරු) |
| ප්‍රධාන ලේකම් | යූ. ඩී. ජයන්ත රණසිංහ මහතා |
| ප්‍රධාන භාණ්ඩාගාරික | ආනන්ද තිස්ස සමරසිංහ මහතා |
| ප්‍රධාන සංවිධායක | 1. සාමවිනිසුරු ආර්. ඩී. ආර්. විජේසිංහ මහතා<br>2. ආර්. ප්‍රේමකුමාර සිරිසේන මහතා |
| නියෝජ්‍ය සභාපති | 1. සාමවිනිසුරු නිමල් කරුණාතිලක මහතා<br>2. මංජුල දයාරත්න මහතා |
| නියෝජ්‍ය ලේකම් | 1. පී. සී. දයාරත්න මහතා<br>2. නීල් සමන්ත කරුණාරත්න මහතා |
| නියෝජ්‍ය භාණ්ඩාගාරික | නලින්ද රුවන් ඉන්දික ගුණරත්න මහතා |
| නියෝජ්‍ය සංවිධායක | 1. එච්. ඩී. සිරිවිමල් ගුණරත්න මහතා<br>2. එම්. ඩී. එම්. ජයතිස්ස මහතා<br>3. ආර්. ඩී. රෝහිත සුමනරත්න මහතා |
| ගිණුම් පරීක්ෂක | ඒ. ඩී. පියදාස මහතා |
| ප්‍රධාන නිළධාරී | විෂ වෛද්‍ය පාලිත චන්ද්‍රලාල් රණමුක මහතා |
| ප්‍රචාරක නිලධාරී (ජනමාධ්‍ය) | 1. සී. අනුර කුලසූරිය මහතා<br>2. වසන්ත රණවීර මහතා<br>3. සුරාන් චතුරංග මහතා<br>4. සුසන්ත නිහාල් මහතා |
| පරීක්ෂක | ආර්. ඩී. කේ. විමලසිරි මහතා |

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.

## නීතිය බලපෑමේ ප්‍රකාශය

***2 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් (117 වන අධිකාරය වූ) ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ 13 වන වගන්තියේ (1) වන උපවගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත උපවගන්තියේ නීතියේ බලපෑම වනුයේ, ලියාපදිංචි කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන සෑම සාධන පත්‍රයකම එම සාධන පත්‍රය බලපාන ඉඩම පිහිටි දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය, පළාත් පාලන ආයතන බල ප්‍රදේශය, ග්‍රාම නිලධාරී කොට්ඨාශය සහ වෙනත් යම් කොට්ඨාශයක් ඇත්නම් එම කොට්ඨාශය ද පැහැදිළිව නිශ්චිතව දැක්විය යුතු බවට නියම කිරීම වේ.